## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2024 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මාර්ස් ශාලාව වෙත ආපනශාලා සේවාවන් සැපයීම සඳහා අයදුම්පත් කැඳවීම

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට 2024 වර්ෂය තුළ දී පහත සඳහන් ආපනශාලා සේවාවන් සැපයීම සඳහා පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2024.01.19 දින සිට 2024.02.01 **දින** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ආපසු නොගෙවන රු 1,000.00 ක ගාස්තුවක් විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා අයදුම්පත් සහ විස්තර පත්‍රිකා 2024.01.19 දින සිට 2024.01.31 දින දක්වා වැඩ කරන දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සරප් අංශයෙන් ලබා ගත හැකිය. නිසිලෙස සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2024.02.01 දින ප.ව 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ***"සභාපති,ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය"*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු බහාලුමේ තැන්පත් කිරීම කළ යුතුය. අදාළ අයදුම්පත් එදිනම ප.ව 1.30 ට විවෘත කරනු ලැබේ. ලංසු පත්‍රිකා බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" විශ්වවිද්‍යාලයේ මාර්ස් ශාලාවේ ආපනශාලා සේවාවන් පවත්වාගෙන යාම සඳහා අයදුම්පත් කැඳවීම**" වශයෙන් සඳහන් කිරීම අනිවාර්ය වේ.

- මේ සඳහා රු.5,000.00 ක වටිනාකමකින් යුත් නැවත ගෙවනු ලබන ලංසු ඇපකරයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් 2024.04.30 දින දක්වා වලංගු වන පරිදි ලබා දිය යුතුය. එසේ නොමැති නම් ඒ හා සමාන මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශයේ තැන්පත් කළ යුතු අතර ලැබෙන ලදුපත ලංසු ලේඛන සමග අමුණා එවිය යුතුවේ.

- මෙම ආපනශාලා සේවාවන් පවත්වා ගෙන යාම සඳහා විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද මිල ගණන් හා බර ප්‍රමාණයන් ලංසු ලේඛණයේ සඳහන් කර ඇත.

- සේවාව අවශ්‍ය කරන ආපනශාලා පහත දක්වා ඇත.

***01. මාර්ස් ශාලා ආපන ශාලාව***

- මෙම සේවාවන් සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්/මිල ගණන් සලකා බැලීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ කිසිදු හේතු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ බලය විශ්ව විද්‍යාලය සතු වේ.

වැඩි විස්තර සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න.

සහකාර ලේඛකාධිකාරී, සාමාන්‍ය සේවා අංශය.

081- 2392438 081-2392436



සභාපති,
ප්‍රසම්පාදන කමිටුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය